# කටුසෑය පුදබිම සම්බන්ධ පොදුජන විශ්වාස පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.එස්.පී. ගුණරත්න[1], එච්.එම්.එන්. සෙව්වන්දි[2]

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලා පරිශ්‍රයේ පිහිටි කටුසෑය පුදබිම සම්බන්ධ පොදුජන විශ්වාස පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කෙරේ. කටුසෑය හා සම්බන්ධව පවතින පොදුජන විශ්වාසයන් සහ එහි පවතින ලක්ෂණ විමර්ශනය කිරීම අධ්‍යයනයේ අරමුණයි. ජන විශ්වාස විද්‍යාත්මක ක්‍රම ඔස්සේ විග්‍රහ කළ නොහැකි වුව ද පවත්නා විශ්වාසයන්ගේ ස්වරූප ඒ හා බැඳුණ සංස්කෘතික චර්යාව සහ රටාවන් හැදෑරීම සඳහා දත්ත රැස්කිරීම සිදුකරන ලදී. මෙහිදී ප්‍රායෝගික ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා මගින් ද ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කරමින් ද දත්ත රැස්කිරීම සිදුකරන ලදී. කටුසෑය හතරැස් වේදිකාවක නිර්මාණය කර ඇති කුඩා ප්‍රමාණයේ ගරා වැටුණ චෛත්‍යයකි. මෙම ස්තූපය මිහින්තලා ආරාමය ඉදිකිරීම සඳහා භාවිත කරන ලද කම්හල් උපකරණ සහ ආයුධ තැම්පත්කර ඉදිකර ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ. දහනව වැනි සියවසේ මුල් භාගයේ කරන ලද කැණීම්වලදී ක්‍රිස්තු වර්ෂ 8-9 සියවස්වල සිංහල සහ සංස්කෘත භාෂාවලින් රචනා කරන ලද මහායාන සූත්‍ර ඇතුළත් තඹ තහඩු මෙම ස්ථානයෙන් සොයා ගෙන ඇත. හතර වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි කටුසෑය පිළිබඳ තොරතුරු ඇතුළත්ව ඇත. මෙහිදී වන්දනයට පාත්‍ර වන්නේ නාග බහිරව, අෂ්ටඵල බහිරව ආදි බහිරව දෙවියන් වුවත් චෛත්‍යයක් වන හෙයින් මේ තුළ රහතන් වහන්සේලාගේ ධාතු ද නිධන් කර ඇතැයි ද සැළකේ. අදෘශ්‍යමාන විශ්වාස ඔස්සේ රටේ විවිධ ප්‍රදේශවලින් කෙම්මුර දිනවලදී විශාල පිරිසක් ඉතා විශ්වාසයෙන් මෙහි පැමිණ පළතුරු වට්ටි පූජාව, කිරි ඉතිරවීම, පොල් ගැසීම ආදි වත්පිළිවෙත් සිදුකිරීම, යාතිකා කිරීම මෙන්ම බාරහාර වීම සුලබ දසුනකි. එසේම මිහින්තලාව හරහා ගමන් ගන්නා රියදුරන් කටුසෑයට පඬුරු ලා යාම පුරුද්දක් කරගෙන ඇත. කෙම්මුර දෙදිනක් තුළ අහඹු ලෙස තෝරාගත් 100 දෙනෙකු සම්මුඛ සාකච්ඡාට ලක්කර අතර ඔවුන්ගෙන් අපේක්ෂාවන් සඵලත්වයට පත්ව ඇති පිරිස 52% වන අතර 48%ක් දෙනා සිය අපේක්ෂාවන් සඳහා මෙම ස්ථානයට පැමිණෙන බව සිදුකළ අධ්‍යයනයෙන් පැහැදිලි විය. සමස්තයක් ලෙස අධ්‍යාපන කටයුතු සඳහා 40%ක් ද අසනීප සඳහා 15%ක් ද රැකියා සඳහා 12%ක් ද විවාහ සඳහා 10%ක් පවුල් ආරවුල් සඳහා 8%ක් ද දරුඵල සඳහා 6% හා වෙනත් කටයුතු සඳහා 9%ක් ද වශයෙනි. පැමිණෙන බහුතරයකගේ සිතුම් පැතුම් ඉටුවීම නිසා මෙන්ම මහත් වූ විශ්වාසයකින් මෙහි පැමිණ භාරහාර වන නිසාවෙන් කටුසෑය පිළිබඳ පොදුජන විශ්වාසයක් ගොඩනැගී ඇති බව සිදුකරන ලද මානව විද්‍යාත්මක අධ්‍යයනයෙන් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** මිහින්තලා, කටුසෑය, අභිචාර, විශ්වාස, සංස්කෘතිය

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. pawithragunarathna123@gmail.com
[2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.